ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | ඉස්ලාම් ධර්මය - I | කාලය පැය 01 යි |
|---|---|---|

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉර ගසන්න.

---

01. ඉස්ලාමීය විශ්වාසය ගොනු කර දීමට බිහි වූ කලාව වනුයේ,
1. ඉල්මුල් ෆික්හ්  2. ඉල්මුල් ජරාඉල්  3. ඉල්මුල් අකීදා  4. ඉල්මුල් ඊමාන්

02. "කිරාමුන් කාතිබුන්" යන අරාබි පදයේ අර්ථය,
1. ගෞරවනීය ලේඛකයින්  2. ව්‍යාජ නබිවරු
3. දූත මෙහෙවර කරන්නන්  4. ප්‍රතික්ෂේප කරන්නන්

03. අහ්ලුස්සුන්නාහ් වල්ජමආල අකීදා න්‍යාය පැහැදිලිව ඉදිරිපත් කළ ඉමාම් වරයා,
1. ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා  2. ඉමාම් බුහාරි (රහ්) තුමා
3. සයිද් ඉබ්නු සාබිත් (රහ්) තුමා  4. අබුල් හසන් අල් අෂ්අරි (රහ්) තුමා

04. ජල වර්ගයෙහි අල්මාඋත්තහූර් යනු,
1. අපිරිසිදු ජලය යි.  2. ඉතා පිරිසිදු ජලය යි.
3. පිරිසිදු ජලය යි.  4. පරිහරණය කළ ජලය යි.

05. දේවවාදයක් හෝ කිසිදු ආගමික විශ්වාසයක් නොමැති තත්ත්වය නම්,
1. රිද්දත්  2. ෂිර්ක්  3. ඉල්හාද්  4. කුෆ්ර්

06. මුතනබ්බිවරයෙකු වන අස්වදුල් අන්සි ඝාතනයට ලක් කළ සහාබිවරයා නම්,
1. ෆෛරුස් තෛලමී තුමා  2. කාලිද් බින් වලීද් තුමා
3. වහ්ෂි බින් හර්බ් තුමා  4. අබූබක්කර් සිද්දීක්තුමා

07. සලාතයේ දුආඋල් ඉස්තිෆ්තාහ් යනු,
1. ආරම්භක තක්බීරයෙන් පසු පාරායණය  2. ඉෘතිදාල් අවස්ථාවේ පාරායණය
3. රුකූඋ අවස්ථාවේ පාරායණය  4. මැද හිඳුමේ පාරායණය

08. උපවාසයේ ෆර්ලුවලින් එකක් වනුයේ,
1. සහර් කිරීම.
2. තරාවීහ් සලාතය ඉටු කිරීම.
3. නියියත් තැබීම.
4. උපවාසයෙන් මිදෙන අවස්ථාවේ දුආ පාරායණය කිරීම.

09. සකාත් ලැබීමට හිමිකම් ලත් කාණ්ඩයකි.
1. අහ්ලුල් බයිත් ය.  2. මුස්ලිම් නොවන්නන් ය.
3. මුර්තද් ය.  4. මුඅල්ලෆතුල් කුලූබ් ය.

10. ජාමිඋල් කුර්ආන් යන ගෞරව නාමය ලැබූ කලීෆාවරයා නම්,
1. උමර් (රලි) තුමා  2. උස්මාන් (රලි) තුමා
3. අබූබක්කර් (රලි) තුමා  4. අලි (රලි) තුමා

11. පරිසරය පිරිසිදුව හා ලස්සනටත්, පොළොවේ ගස් සිටුවා හරිතවත් කිරීමත් අයත්වන ක්‍රියාව,
1. ඉබාදත් ක්‍රියාවකි  2. ඉරාදත් ක්‍රියාවකි
3. ඉමාරත් ක්‍රියාවකි  4. කිලාෆත් ක්‍රියාවකි

12. නෆ්සුල් අම්මාරා බිස්සූඃ යනු,
   1. අයහපතට පොළඹවන සිත
   2. තමාව රිදවගන්නා සිත
   3. තෘප්තිමත් සිත
   4. පාරිශුද්ධ වූ සිත

13. පැවිදි තත්ත්වයට ගෙන යාම යන්න.
   1. රහ්බානියා
   2. වරළු
   3. සුහුද්
   4. තව්බා

14. අ සහ ආ ගැළපෙන ලෙස යා කළ විට ලැබෙන පිළිතුර සහිත වරණය වන්නේ,

| | | |
|---|---|---|
| 1) | අස්සබ්ර් | දැනුම |
| 2) | අත්තවක්කුල් | ඉවසීම |
| 3) | අල් මඃරිෆා | ගැළපීම |
| 4) | අර් රිලා | වගකීම් පැවරීම |

   1. BACD
   2. BDAC
   3. ADBC
   4. CADB

15. හිරා ගුහාවට අයත් කඳු වැටියේ නම වන්නේ,
   1. ජුදිස්සු
   2. තුර්සිනා
   3. එවරස්ට්
   4. ජබලුන්නූර්

16. අල්ලාහ්ගේ විශේෂ නාමයන් අතර අල්මුඃනි යන්නෙහි අර්ථය නම්,
   1. කරුණාවන්තයා
   2. පාලනය කරන්නා
   3. ධනපතියෙකු බවට පත් කරන්නා
   4. ලබා දෙන්නා

17. "පාරායණය කර පෙන්වූ වහී" යන්නට අරාබියෙන්,
   1. තර්තීබුත් තිලාවත්
   2. තර්තීබුන් නුසුල්
   3. වහී මත්ලූව්
   4. වහී ගෛරු මත්ලූව්

18. අල්කුර්ආනය නමින් මුස්ලිම්වරු භේද නොවිය යුතු ය. යන අදහස කලීෆා උස්මාන් (රලි) තුමාට ඉදිරිපත් කළ සහාබිවරයා,
   1. සයිද් බින් සාබිත් (රලි)
   2. සල්මානු ෆාරිස් (රලි)
   3. අහ්මද් බින් හම්බල් (රහ්)
   4. හුදෛෆා අල් යමානි (රලි)

19. ෆික්හ් කලාවේ ස්වර්ණමය යුගය ලෙස හඳුන්වන්නේ,
   1. නබි (සල්) තුමාගේ කාලය
   2. තාබිඊන්වරුන්ගේ කාලය
   3. සහාබාවරුන්ගේ කාලය
   4. තබඋත්තාබිඊන්වරුන්ගේ කාලය

20. ඉජ්මාඋස් සකුති යන්න,
   1. නිශ්ශබ්ද ඉජ්මාව
   2. පැහැදිලි ඉජ්මාව
   3. ඒකමතික තීරණය
   4. බහුතරයකගේ ඉජ්මාව

21. සිතින් කරන ජිහාදය හඳුන්වන්නේ,
   1. තස්කියතුන් නෆ්ස්
   2. නෆ්සුල් මුත්මඉන්නා
   3. මුජාහදතුන් නෆ්ස්
   4. නෆ්සුල් ලව්වාමා

22. අර්කානුල් කියාස්හි, අල්කුර්ආන් හා සුන්නාහ්වෙන් ලබාගත් තීරණ හඳුන්වන්නේ,
   1. අල් අස්ල්
   2. අල් ඉල්ලත්
   3. අල් ෆර්උ
   4. අල් හුකුම

23. ඉමාම්වරු හය දෙනෙකුගේ හදීස් සංස්කරනය වන්නේ,
   1. මුවත්තා
   2. අස්සිහාහුස්සිත්තා
   3. මුස්නද්
   4. සහීහුල් බුහාරි

24. ඉමාමුල් මදීනා යන විශේෂ නාමය ලද ෆික්හ් කලාවේ ඉමාම්වරයා නම්,
   1. ඉමාම් අබුහනීෆා (රහ්)
   2. ඉමාම් ෂාෆඊ (රහ්)
   3. ඉමාම් මාලික් (රහ්)
   4. ඉමාම් හම්බලි (රහ්)

25. අසදුල්ලාහ් හෙවත් අල්ලාහ්ගේ සිංහයා යන නම ලද කලීෆාවරයා වන්නේ,
   1. අලි (රලි) තුමා
   2. උමර් (රලි) තුමා
   3. උස්මාන් (රලි) තුමා
   4. අබුබක්කර් (රලි) තුමා

26. කලීෆා උමර් (රළි) තුමාගේ කාලයේ ශ්‍රී ලංකාවට ඉස්ලාමය හඳුන්වා දුන් බව, සඳහන් කරන ඉබ්නු සහ්රයාර් තුමාගේ ග්‍රන්ථය නම්,
1. ෆුතුහුල් බුල්දාන් 2. අජාඉබුල් හින්ද් 3. සිලෝන් 4. මුස්ලිම් නේසන්

27. "ගෝත්‍ර වර්ධනයට කැපවීම නොහොත් ගෝත්‍ර හැඟීම්" හඳුන්වන අරාබි පදය නම්,
1. ශුඌබ් 2. අසබියියා 3. කබීලා 4. ශෙකු

28. මක්කා ජයග්‍රහණය සිදු වූ හිජ්රි වර්ෂය නම්,
1. හි. ව. 2 2. හි. ව. 6 3. හි. ව. 8 4. හි. ව. 10

29. සලාතයේ දී තව්රරුක් යනු,
1. පළමු තක්බීරය 2. අවසන් අත්තහියාත් හිඳුම
3. මැද හිඳුම 4. රුකූඋ අවස්ථාව

30. හජ් ඉටු කිරීමේ දී අරෆාහි රැඳිය යුතු දිනය නම්,
1. දුල්හජ් 8 2. දුල්හජ් 9 3. දුල්හජ් 10 4. දුල්හජ් 11

31. "අසන්බෙ සරිත්තිරම්" යන නව කථාව රචනා කළේ,
1. ටී. බී. ජායා 2. අබ්දුල්ලාහ් ෆාතිබ් 3. වාපිච්චෙයි මරික්කාර් 4. සිද්දි ලෙබ්බෙ

32. කොවිඩ් 19 රෝගය පැතිරීම වැළැක්වීම සඳහා රජය විසින් ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන අවස්ථාවේ දී, අකීල් ඔහුගේ යහලුවන් සමඟ සලාතය සඳහා නිතර නිතර මස්ජිදයට ගියහ. එම ක්‍රියාව හඳුන්වන්නේ,
1. 27 ගුණයකින් පින් ලැබෙන ක්‍රියාවකි. 2. එම ක්‍රියාව ෆර්ලු ක්‍රියාවකි.
3. එම ක්‍රියාව නීතිය පටහැනි ක්‍රියාවකි. 4. වසංගතය යනු ආගමේ සඳහන් නොවන දෙයකි.

33. ස්වාමියාගේ මරණයෙන් පසු බිරිඳ, ඉද්දා සිටිය යුතු කාලය වන්නේ,
1. දින 40 කි 2. මාස 3 යි දින 10 කි
3. මාස 4 කි 4. මාස 4 යි දින 10 ක්

34. සීරා තොරතුරු හි. ව. 151 දී ප්‍රථමයෙන්ම ලේඛණ ගත කිරීමට මුලිකත්වය දැරුවේ,
1. මුහම්මද් බින් ඉස්හාක්තුමා 2. අබ්දුල් මලික් බින් හිෂාම්තුමා
3. ඉමාම් අබු හනීෆා තුමා 4. ඉමාම් අහ්මද් ඉබ්නු හම්බල්තුමා

35. භාණ්ඩය ගත් මිලට වෙළෙඳ පොලේ මිල අනුව, ලාභය එකතු කර විකිණීම හඳුන්වන්නේ,
1. අල් මුරාබහා 2. අල් මුලාරබා 3. අල් මුෂාරකා 4. අල් අරියත්

36. පේෂ කර්මාන්තයේ නියැලුන නබිවරයා වන්නේ,
1. නුහ් (අලෛ) තුමා 2. දාවුද් (අලෛ) තුමා
3. ඉද්රිස් (අලෛ) තුමා 4. සකරියා (අලෛ) තුමා

37. සමාජය වහල් භාවයෙන් නිදහස් කළ, නබි මුසා (අලෛ) තුමාගේ ඉතිහාසය පිළිබඳ සඳහන් වන සූරාව වන්නේ,
1. සූරා ලුක්මාල් 2. සූරා අඃරාෆ් 3. සූරා බකරා 4. සූරා කහ්ෆ්

38. ප්‍රමුඛත්වය දිය යුතු දේට ප්‍රමුඛත්වය දිය යුතුය. යන්නට පවසන අරාබි පදය,
1. ඉජ්තිහාද් 2. වසතියා 3. ඉජ්මා 4. ෆික්හුල් අව්ලවියාත්

39. ඊජාබ් හා කබූල් යන වචන භාවිතා කරන කටයුතු දෙකක් වන්නේ,
1. ගිවිසුම් හා සාක්ෂි 2. විවාහය හා දික්කසාදය
3. දඬුවම හා නිදහස් කිරීම. 4. ගණුදෙනු හා විවාහය

40. හනීෆාවරු යනුවෙන් හඳුන්වන්නේ,
1. ජාහිලියා යුගයේ අල්ලාහ්ට යමක් නොසැසඳූ අය 2. හිජ්රත් ගමනට සහභාගි වූ අය
3. නබි තුමාට විරුද්ධ වූ අය 4. අග්නි පූජා පැවැත්වූ අය

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | ඉස්ලාම් ධර්මය - II | කාලය පැය 02 යි. |
|---|---|---|

- පළමු ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. කෙටි පිළිතුරු සපයන්න.

1) අකීදාහි අල්ඉලාහියියාත්තයට අඩංගු වන කරුණු මොනවාද?
2) ආගම සහ සුහුෆ් දෙකම ලැබූ නබිවරයා නම් කර එතුමාට ලැබුණු සුහුෆ් සංඛ්‍යාවද ලියන්න.
3) ෂිර්ක් ආකාර දෙක ලියා, එයට උදහාරණය බැගින් දක්වන්න.
4) මූලික නිශ්චිත ඉබාදත් හි ශරීරය හා ක්‍රියාව සම්බන්ධ ඉබාදත් දෙකක් ලියන්න.
5) අත්තහාරත් පිළිබඳව ඇති කෙටි අල්කුර්ආන් වැකියක් හෝ හදීසයක් ලියන්න.
6) ෆික්හ් ක්ෂේත්‍රයට දායක වූ ඉමාම්වරුන් දෙදෙනෙක් නම් කරන්න.
7) සලාතය නිසා මුස්ලිම්වරයෙකුට ආරක්ෂා විය හැකි පව්වලින් 2 ක් ලියන්න.
8) අබූබක්කර් (රලි) තුමාගේ සහ උස්මාන් (රලි) තුමාගේ කාලයේ දී අල්කුර්ආනය ගොනු කිරීමට පෙළඹවූ සහාබිවරුන් දෙදෙනා කව්රුන්ද?
9) අල්ලාහ් සාදිකුන් යනුවෙන් අමතන්නේ කාටද?
10) උම්මත් සහ වසතියා යන්න කෙටියෙන් පහදන්න.

(2x10 – 20)

02.

1) තව්හිද් යන්නෙහි අදහස මොනවාද?
2) ෂිආවරුන් බිහිවීමට බලපෑ හේතුව කෙටියෙන් පහදන්න.
3) අකීදාව කේන්ද්‍ර කොටගෙන බිහිවූ විවිධ දාර්ශනික කණ්ඩායම් 5 ක් නම් කරන්න.

(2+3+5=10)

03.

1) සකාතයේ ෆර්ලයන් 2 මොනවාද?
2) සකාත් සාමූහික වශයෙන් ඉටු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 3 ක් ලියන්න.
3) උපවාසය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයන් 5 ක් ලියන්න.

(2+3+5=10)

04.

1) ඉජ්තිහාද් හා මුජ්තහිද් යන වචන අර්ථ දක්වන්න.
2) ෆික්හ් කලාවේ ඉමාම්වරු තිදෙනෙක් නම් කර ඔවුන්ගේ චින්තන විප්ලවයන්ද සඳහන් කරන්න.
3) කලීෆා උමර් (රලි) තුමාගෙන් කිලාෆතයට ඉටු කළ සේවාවන් 5 ක් ලියන්න.

(2+3+5=10)

05.

1) මස්ජිදුල් අක්සාව පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.
2) "සීරාව ඉගෙන ගෙන එය ආරක්ෂා කළ යුතුය" යන්නට හේතු වූ කරුණු 3 ක් ලියන්න.
3) මස්ජිදුන් නබවියෙන් සිදුවූ සේවාවන් 5 ක් ලියන්න.

(2+3+5=10)

06.

1) ඉස්ලාම් ආර්ථිකයේ මූලික සංකල්ප 2 මොනවාද?
2) ඉපැයීම යාඥාවක් ලෙස සැලකීමට අනුගමනය කළ යුතු ක්‍රියාවන් 3 ක් ලියන්න.
3) අජ්නබිවරයෙකු ඉදිරියේ හැසිරිය යුතු ආකාර 5 ක් ලියන්න.

(2+3+5=10)

07. පහත සඳහන් ඒවායින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1) ඉස්ලාම් පෙන්වා දී ඇති මානව අයිතිවාසිකම්
2) තරුණ කාලය යහපත් මගකට යොමු කර ගැනීම සඳහා ඉස්ලාම් පෙන්වා දෙන ක්‍රියා
3) මාධ්‍ය අනුගමනය කළ යුතු ගුණාංගයන්
4) ශ්‍රී ලංකාවේ ආර්ථික දියුණුව උදෙසා මුස්ලිම්වරුන්ගේ දායකත්වයන්.

(5+5=10)

**පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)**

**11 ශ්‍රේණිය**

**ඉස්ලාම් ධර්මය (පිළිතුරු පත්‍රය)**

1- පත්‍රය.

| | | | |
|---|---|---|---|
| 1 - 2 | 11 - 2 | 21 - 2 | 31 - 4 |
| 2 - 1 | 12 - 1 | 22 - 4 | 32 - 3 |
| 3 - 4 | 13 - 1 | 23 - 3 | 33 - 4 |
| 4 - 3 | 14 - 2 | 24 - 2 | 34 - 1 |
| 5 - 2 | 15 - 4 | 25 - 1 | 35 - 1 |
| 6 - 1 | 16 - 3 | 26 - 3 | 36 - 3 |
| 7 - 1 | 17 - 2 | 27 - 2 | 37 - 2 |
| 8 - 3 | 18 - 4 | 28 - 3 | 38 - 4 |
| 9 - 4 | 19 - 4 | 29 - 3 | 39 - 4 |
| 10 - 3 | 20 - 1 | 30 - 2 | 40 - 1 |



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440